ජාතික අවම වේතනය රු. 27000.00 දක්වා වැඩි කෙරේ...........






සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන) පනත් කෙටුම්පත (2005 අංක 36 දරන පනත ) 2025 අංක 9 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන) පනත ලෙසත්, සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන) පනත් කෙටුම්පත (2016 අංක 4 දරන පනත) 2025 අංක 10 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන) පනත ලෙසත්, සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත 2025 අංක 11සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත ලෙසත් බලාත්මක වේ.
ඒ අනුව 2025 අංක 09 දරන සේවකයනගේ අයවැය සහන දීමනා (සංශෝධන) පනත මගින් සේවකයන්ගේ අයවැය සහන දීමනාව 2025 මාතර්ු 31 දින සිට ගෙවීම නැවැත්වීම 2025 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබේ.

එමෙන්ම 2025 අංක 10 දරන, සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන) පනත මගින් 2025 මාතර්ු මස 31 වන දින සිට බලපැවැත්වෙන පරිදි අයවැය සහන දීමනාව ගෙවීම නැවැත්වීම , 2025 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබේ.

එමෙන්ම 2025 අංක 11 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනතේ ප්‍රධාන වෙනස්කම් වනුයේ,

1. 2025 අප්‍රේල් 1 සිට දෙසැම්බර් 31 දක්වා:
ජාතික අවම මාසික වේතනය රු. 27,000 (රු. 9,500 ක වැඩි කිරීමකින්)
ජාතික අවම දෛනික වේතනය රු. 1,080 (රු. 380 ක වැඩි කිරීමකින්)

2. 2026 ජනවාරි 1 සිට:
ජාතික අවම මාසික වේතනය රු. 30,000 (තවත් රු. 3,000 ක වැඩි කිරීමකින්)
ජාතික අවම දෛනික වේතනය රු. 1,200 (තවත් රු. 120 ක වැඩි කිරීමකින්)
සහ අයවැය සහන දීමනා සේවකයන්ගේ වේතනයේ කොටසක් ලෙස ඇතුළත් කිරීම සිදු කර තිබේ. එමෙන්ම පනත 2025 අප්‍රේල් 1 වැනි දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබේ.

Hon. Speaker of Parliament endorses the certificate on the Budgetary Relief Allowance of Workers (Amendment) Bill, Budgetary Relief Allowance of Workers (Amendment) Bill, and National Minimum Wage for Workers (Amendment) Bill

The Hon. Speaker Dr. Jagath Wickramaratne today (23) endorsed his certification on the three Bills, namely, the Budgetary Relief Allowance of Workers (Amendment) Bill to amend Act No. 36 of 2005, the Budgetary Relief Allowance of Workers (Amendment) Bill to amend Act No. 4 of 2016, and the National Minimum Wage for Workers (Amendment) Bill.

The Second Reading debate on this set of three Bills was held yesterday (22) in Parliament, at which all three Bills were passed by Parliament.

This set of three Bills was presented to Parliament for the First Reading on 03.06.2025.

Accordingly, the Budgetary Relief Allowance of Workers (Amendment) Bill (to amend Act No. 36 of 2005) shall come into operation as the Budgetary Relief Allowance of Workers (Amendment) Act, No. 9 of 2025; the Budgetary Relief Allowance of Workers (Amendment) Bill (to amend Act No. 4 of 2016) shall come into operation as the Budgetary Relief Allowance of Workers (Amendment) Act, No. 10 of 2025; and the National Minimum Wage for Workers (Amendment) Bill shall come into operation as the National Minimum Wage for Workers (Amendment) Act, No. 11 of 2025.

Accordingly, by the provisions of the Budgetary Relief Allowance of Workers (Amendment) Act, No. 9 of 2025, the payment of the Budgetary Relief Allowance of Workers is deemed to have been discontinued with effect from 31st March 2025 and to have come into operation from 1st April 2025.

Further, by the provisions of the Budgetary Relief Allowance of Workers (Amendment) Act, No. 10 of 2025, the discontinuation of the payment of the Budgetary Relief Allowance, operative from 31st March 2025, is deemed to have come into operation from 1st April 2025.

In addition, the principal amendments introduced by the National Minimum Wage for Workers (Amendment) Act, No. 11 of 2025, are as follows:

1. For the period from 1st April 2025 to 31st December 2025:

National minimum monthly wage: Rs. 27,000 (an increase of Rs. 9,500)

National minimum daily wage: Rs. 1,080 (an increase of Rs. 380)

2. From 1st January 2026 onwards:

National minimum monthly wage: Rs. 30,000 (a further increase of Rs. 3,000)

National minimum daily wage: Rs. 1,200 (a further increase of Rs. 120)

Further, the Budgetary Relief Allowance has been incorporated as a component of the workers’ wage. The Act is deemed to have come into operation with effect from 1st April 2025.